# කුංචුට්ටු කෝරළයේ සාම්ප්‍රදායිකව පැවත එන පුල්ලෙයාර් ඇදහීම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

සේනානායක එස්.ආර්.එල්. සහ ජී පී කේ දිල්රංග

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, රජරට විශ්වවිද්‍යාලය
randisenanayaka09@gmail.com

**සාරසංක්ෂේපය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුංචුට්ටු කෝරළයේ ජන සංස්කෘතිය තුළ සංස්කෘතික ලක්ෂණ බොහෝමයක් අන්තර්ගතව ඇත. ඒ අතර ඇදහිලි විශ්වාස සුවිශේෂී ස්ථානයක් ගනී. ඒවායින් මේ ප්‍රදේශය ආශ්‍රිත සාම්ප්‍රදායික පුල්ලෙයාර් ඇදහීම හා බැඳුණු අභිචාර විධි ජනයාගේ ආකල්ප සඳහා කෙසේ බලපානු ලබන්නේදැයි අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුව වේ. මෙහිදී පුල්ලෙයාර් දේව වන්දනය සිදු කරන අන්දම සහ ඇදහීම තුලින් සමාජය අපේක්ෂිත කාරණා මොනවාද යන්න අධ්‍යයනයේ අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගැනීම සිදු කරන ලදී. හින්දු ආභාසයත් සමඟ වන්දනයට හුරු වූ සංස්කෘතික අංගයක් ලෙස ගණ දෙවි ඇදහීම හඳුනාගත හැකි ය. සාම්ප්‍රදායික කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගෙවන ප්‍රාදේශීය ජනයා කුඹුරුවලට සිදුවන ස්වාභාවික හා සත්ත්ව හානි නොවී අස්වැන්න ලබාගන්නා තුරු ගොවිතැන ආරක්ෂා කොට දෙන මෙන් පුල්ලෙයාර් දෙවියන්ගෙන් ඉල්ලා සිටී. අස්වැන්න ලබාගත් පසු දෙවියන් උදෙසා චාරිත්‍රානුකූලව පුද පූජා පවත්වයි. මේ සඳහා අලුත් සහල් භාවිතා කර කඩල, මුං ඇට, හකුරු ආදිය යොදාගෙන කිරිබතක් සකසාගනී. ඊට අමතරව කැවුම්, කෙසෙල්, පුවක්, බුලත්, මෝදකන් සහිත තට්ටු සකසා ගල් මත අඳිනු ලබන සංකේතාත්මක දේව ප්‍රතිමාවට පූජා කරයි. මේ සමඟම බෝල්පනා අත්තක් නිරූපනය කරමින් වන්නිය බංඩාර දෙවියන්ටද එලෙසම පූජාවන් සිදුකරන්නේ කැළෑවට අධිපති දෙවියන් වන හෙයිනි. මෙම කාර්යයේ දී සුවඳ දුම් ඇල්ලීම, පහන් දැල්වීම, බුලත් පුවක් කහ වතුරෙන් සේදීම යනාදිය මඟින් අපේක්ෂා කරන්නට ඇත්තේ මෙම කෘෂි ජන සමාජවල නිවාස, ඉඩකඩම්, වගාභූමි, පශු සම්පත, වැව් හා ඇළවේලි, කැලෑරොද ආදී සියලු ස්ථානයන්හි ආරක්ෂාව හා සමෘද්ධිය සැලසීම උදෙසා කෘතගුණ දැක්වීමයි. ඒ තුළින් පිළිබිඹු වන්නේ මෙම ප්‍රදේශයේ ජනයාගේ මානව ගුණාංගයන් තුළින් පුද පූජා හා ඒ ආශ්‍රිත ඇදහිලි හා විශ්වාස පුද්ගල ජීවිතයට සහ ඔවුන්ගේ යහපැවැත්මට හේතු වී තිබෙන බවයි. තවද ප්‍රාදේශීය වැසියා තම අස්වැන්නෙන් පළමු කොටස පුල්ලෙයාර් දෙවියන් උදෙසා වෙන් කිරීම හරහා තම ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකාර්මික කටයුතු වලින් සාර්ථක අස්වැන්නක් ලැබී ඇති බව හා ගොවියාගේ කන්නලවුවට දෙවියන් උපකාර කර ඇති බව කිවහැකිය. මේ ආකාරයට කුංචුට්ටු කෝරළයේ ජනයා කාලයක් මුළුල්ලේම තම සුබ කාර්‍යයන් සියල්ලක් පුල්ලෙයාර් හෙවත් ගණ දේව ඇදහීම හා බාරහාර සිදු කිරීම මඟින් සාර්ථක කරගෙන ඇත. එම ඇදහිලි විශ්වාස හා අභිචාර විධි මෙම ජන සමාජයේ කෘෂි ආර්ථික දියුණුවට ඉවහල් වූ බවත්, එකී ප්‍රදේශයේ ජනයාගේ ආකල්ප වෙනස් මගකට යොමු කරවීමට සමත්ව ඇති බවත් මෙහිදී අනාවරණය විය.

**ප්‍රමුඛ පදඃ** *අස්වැන්න, ඇදහිලි, කෘෂි, පුල්ලෙයාර්, සාම්ප්‍රදායික*